# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/19 - 2018 සැප්තැම්බර් මස 04 වැනි අඟහරුවාදා - 2018.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 67.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් කිසිදු වෙළෙන්දෙකු, ආහාර පාන සපයන්නෙකු, සැකසූ ආහාර සපයන්නෙකු හා/හෝ ආහාර පාන සැපයීමේ ව්‍යාපාරයක හෝ ඒ හා සමාන හෝ ඒ හා සම්බන්ධ ක්‍රියාවක/ක්‍රියාවලියක නිරත වන තැනැත්තෙකු/තැනැත්තන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ප්‍රකාශයට පත් කළ ශ්‍රී ලංකා ප්‍රමිති 956 එනම්, ආහාර සැපයුම් ආයතන සඳහා යහපත් සෞඛ්‍යාරක්ෂිත භාවිත සංග්‍රහය පිළිබඳ ප්‍රමිතිය පාදක කරගෙන නිකුත් කරන ලද යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) සඳහා වූ සහතිකයක් ලබා ඇත්නම් මිස, එවන් ව්‍යාපාරයන් හි නියැලීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

කෙසේ වුවද, එවැනි වෙළෙන්දෙකු, ආහාර පාන සපයන්නකු, සැකසූ ආහාර සපයන්නෙකු සහ හෝ එවැනි ආහාර පාන සපයන ව්‍යාපාරයක නියැලෙන වෙනත් යම් තැනැත්තෙකු විසින් ප්‍රතීතකරණ සහතික ලත් ආයතනයකින් HACCP, FSSC 22000 හෝ ISO 22000 සහතිකයක් ලබා ඇත්නම් එවිට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරනු ලබන ඉහත සහතිකය ලබාගැනීමෙන් නිදහස් වනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් 2015 ජූනි මස 11 වන දින අංක 1918/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද විධාන අංක 56 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2019 මාර්තු මස 01 වන දින සිට බලාත්මක වනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

අනුර බී මැද්දේගොඩ,
සභාපති.

2018 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

09 - 464

1A - PG 4202 — 207 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*